## පොහොර භාවිතය

කඳේ පාදයේ සිට සෙන්ටිමීටර් 20-25 ඇතින් කඳ වටා පොහොර යොදා කඳ මුලට පස් ලං කරන්න.

## පොහොර නිර්දේශය

| යොදන අවස්ථාව | ප්‍රමාණය (kg /ha) | | |
|---|---|---|---|
| | යූරියා | TSP | MOP |
| **මූලික** (සිටුවා සති 2 න්) | 85 | 120 | 125 |
| **මතුපිට 1** (සිටුවා මාස 2 1/2-3) | 85 | - | 60 |
| **මතුපිට 2** (සිටුවා මාස 4-4 1/2 දී) | 85 | - | 60 |

## වල් මර්ධනය

පොහොර යෙදීම හා වල් මර්ධනය එකවිට සිදු කිරීම ප්‍රායෝගිකය.

## අතුරු වගාව

- හෝගය මාස 3 1/2-4 තෙක් භූමිය ආවරණය නොකරයි.
- භූමියෙන් උපරිම ප්‍රයෝජනයට කෙටි කාලීන භෝග අතුරු වගාවන් ලෙස පිහිටුවීම වාසි සහගතය.

## අස්වැන්න නෙළීම

- වර්ගයේ පරිණතියට අනුව අස්වනු ගැලවීම කළ යුතුය.
- ගැලවූ අල දින 03 කට පසු ආහාරයට නුසුදුසු බැවින් පලුදු නොවන ලෙස අල ගැලවීම කළ යුතුය. එසේ වුවත් වැලලීම, කොහුබත් වල ගබඩාව හා පිදුරු ආස්තරිත ක්ෂේත්‍ර කඳුවල රැස්කිරීමෙන් සති 2-3 ක් දක්වා ගබඩා කර තබා ගත හැක.



## අපනයනය සඳහා නිපදවන්නේ නම් අලයක සම්මත ප්‍රමිතීන්

- දුඹුරු ශල්කමය පිට පොත්ත
- රතු ඇතුල් පොත්ත
- අලයේ දිගු ගෙලක් පිහිටීම
- අලයක් කි.ග්‍රෑම්. 1-1.5 ක බරක් සහිත වීම
- සෙ.මී. 30-40 ක් දික්වීම
- පලුදු නොවීම

MU 51 (පේරාදෙණිය වර්ගය) මෙම සම්මතයන් සපුරාලයි.






සැකසුම :

අනෝමා ප්‍රේමතිලක (පර්යේෂණ නිලධාරිනි)
කමනි දේවිකා (කෘෂි උපදේශිකා)
ආර්. කේ. සී. සඳමාලි (ව්‍යාපෘති නිලධාරිනි)

උද්‍යාන භෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය
ගන්නෝරුව



Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Peradeniya.


"අපි වවමු - රට නඟමු"

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම
2007- 2010

# මඤ්ඤොක්කා වගාව




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
2009

# හැඳින්වීම

යැපුම් කෘෂිකර්මයේ අනිවාර්ය භෝගයක් වන මඤ්ඤොක්කා අද වාණිජ භෝගයක් මෙන්ම විදේශ විනිමය උපයන අපනයන භෝගයකි.

ආහාර භෝග අතර වැදගත් ස්ථානයක් හිමි කරගන්නාවූ ද අල භෝග අතර පුළුල්ව වගා කෙරෙන්නාවූ ද භෝගය මෙයයි. වියළි කලාපයේ වාර්ෂික භෝගයක් ලෙසත් තෙත් කලාපයේ කන්න භෝගයක් ලෙසත් මඤ්ඤොක්කා වගා වේ. පොල් හා රබර් වගා තුල අතුරු භෝගයක් ලෙසද එය වගා කෙරේ.

# වගා තොරතුරු

## පෝෂණ ගුණය

මඤ්ඤොක්කා මඟින් ප්‍රධාන වශයෙන් ශක්තිය ලබාදෙන අතර විටමින් හා ඛනිජ ලවණ වලින් පොහොසත්ය. පත්‍රවල ප්‍රෝටීන් හා ඛනිජ ලවණ අඩංගු වේ.

මඤ්ඤොක්කා, සැකසූ ආහාර හා සත්ව ආහාර නිෂ්පාදනයේදී මෙන්ම කර්මාන්ත අමු ද්‍රව්‍යක් ලෙස ද භාවිතා කරයි.

## දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 1500 ක් දක්වා පුළුල් පරාසයක වූ පාංශු හා දේශගුණික තත්වයන් හි සාර්ථකව වගා කල හැක.

## බිම් සැකසීම හා දඬු සිටුවීම

- සැහැල්ලු පසක් ඇතිකිරීමට වැස්සත් සමඟ සී සෑම හා වැසි කාලයත් සමඟ දඬු සිටුවීම යෝග්‍යය.
- තෙත් කලාපයේ යල හා මහ කන්න දෙකෙහිදීත් වියලි කාලාපයේ මහ කන්නයේදීත් වගා කෙරේ

## රෝපණ ද්‍රව්‍ය

- පෙර කන්නයේ වැඩි අස්වනු දුන්, මව් ශාක භාවිත කළ යුතුය.
- මේරූ, කෘමි හා රෝග ග්‍රාහි හා අංකුර මෝදු නොවූ, පළුදු නොවූ දඬු ලබා ගත යුතුයි.
- අංකුර 5-7 සහිත 20-25 cm දිගු දඬු කැබලි සුදුසුය.
- අංකුර 2-3 පස මතුපිට සිටිනසේ තනි කැබැල්ලක් සෘජුව හෝ ආනතව සිටුවිය යුතුය.

## නිර්දේශිත පරතරය හා පැළ ගහණය

- අතු බෙදෙන වර්ග 120 cmx120 cm
- මධ්‍යස්ථව අතු බෙදෙන වර්ග 90 cmx90 cm
- අපනයනය සඳහා නිපදවීම 75 cmx75 cm
- පොල් වගාවක අතුරු භෝගයක් වූ විට පොල් ගසේ සිට මීටර් 2 ක් දුරින් සිටුවනු ලබයි.

## නිර්දේශිත ප්‍රභේද

විෂ අවම බව, වැඩි ගුණාත්මය, අස්වැන්න හා අපනයන විභවය මත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගාවට නිර්දේශ කර ඇත්තේ වර්ග 6 කි.

| | MU 51 | CARI 555 | කිරි කවඩි | සුරනිමල | ස්වර්ණ | ශානි |
|---|---|---|---|---|---|---|
| |  |  |  |  |  |  |
| වයස | මාස 9-12 | මාස 9-12 | මාස 6-12 | මාස 9-12 | මාස 9-12 | මාස 9-12 |
| පැළෑටි සැලැස්ම | සෘජු | සෘජු | පඳුරු | සෘජු | සෘජු | සෘජු |
| අස්වැන්න (t/ha) | 35-40 | 35-40 | 22-75 | 35-40 | 35-40 | 35-40 |
| HCN ප්‍රමාණය (mg /kg) | 40-45 | 25-32 | 18-22 | 34-38 | 20-25 | 43-45 |
| පිටත හා ඇතුලත පොත්තේ පැහැය | දුඹුරු/ දම් රෝස | දුඹුරු/ ලා රෝස | සුදු/ සුදු | දුඹුරු/ රෝස | දුඹුරු/ කහ පැහැති සුදු | දුඹුරු/ තද රෝස |
| මදයේ පැහැය | සුදු | සුදු | සුදු | සුදු | ලා කහ | සුදු |
| ගෙල | ඇත | ඇත | නැත | ඇත | ඇත | ඇත |
| පිසීමේ ගුණය | ඉහළයි | ඉහළයි | ඉහළයි | ඉහළයි | ඉහළයි | ඉහළයි |
| අපනයන විභවය | ඇත | ඇත | නැත | ඇත | - | - |